සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 2025
## Second Term Test - 2025

7 ශ්‍රේණිය | භූගෝල විද්‍යාව | කාලය පැය 02 යි

නම/ විභාග අංකය:

## I - කොටස

සැලකිය යුතුයි

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

- **අංක 01 සිට 05 තෙක් ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා හිස්තැන් මත ලියන්න.**

01. පෘථිවි ආදර්ශ ගෝලයේ දකුණු අක්ෂාංශ අංශක 23. 5 රේඛාව ...................................................... නිවර්තන ලෙස හඳුන්වයි. (කර්කටක / මකර / ආක්ටික්)

02. අක්ෂාංශ හා දේශාංශ පදනම් කරගෙන පිහිටීම දැක්වීම ........................................................... පිහිටීම ලෙස හඳුන්වයි. (නිරපේක්ෂ / සාපේක්ෂ / අනපේක්ෂ)

03. ශ්‍රී ලංකාවට අයත් රාෂ්ට්‍රීය මුහුදු සීමාවට නාවික සැතපුම් ........................................................ ක සීමාවක අයිතිය උරුම කර දී ඇත. (12 / 24 / 200)

04. මාර්තු සහ .......................................................................... මාසවල ශ්‍රී ලංකාවට පළමු සංවහන වර්ෂා ලැබේ. (අප්‍රේල් / මැයි / අගෝස්තු)

05. මුහුදු මට්ටමේ සිට 300m ට වඩා උසින් වැඩි ප්‍රදේශ ......................................................................... භූ දර්ශනයට අයත් වේ. (කඳුකර / තැනිතලා / බෑවුම්)

- **අංක 06 සිට 10 තෙක් ප්‍රශ්නවල දැක්වෙන ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන් තුළ යොදන්න.**

06. බ්‍රසීලය දකුණු ඇමරිකා මහද්වීපය තුළ පිහිටි රටකි. ( )

07. පෘථිවි ආදර්ශ ගෝලයේ උත්තර ධ්‍රැවය හා දක්ෂිණ ධ්‍රැවය හරහා හරි මැදින් විහිදෙන දේශාංශ රේඛාව ග්‍රිනිච් රේඛාව ලෙස හඳුන්වයි. ( )

08. ශ්‍රී ලංකාවේ දෙවුන්දර තුඩුවේ සිට පේදුරුතුඩුව තෙක් දුර 224 km කි. ( )

09. දකුණු ආසියාවේ ඉහළම සාක්ෂරතාවයක් පවතින රට ඉන්දියාවයි. ( )

10. ශ්‍රී ලංකාව බහු වාර්ගික හා බහු ආගමික රටකි. ( )

- **අංක 11 සිට 15 තෙක් ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තිත් ඉර මත ලියන්න.**

11. දකුණු ආසියාවට අයත් රටවල් අතරින් මාලදිවයින හා ........................................................ දූපත් ලෙස පවතී.

12. වියළි කලාපයේ කුඩා හෙල්වැටි අතරින් ගලා බසිනා ගංගා හරස් කර ........................................................ ඉදි කර තිබේ.

13. තල් ගස .................................................. ප්‍රදේශයේ ප්‍රධාන වෘක්ෂය වේ.

14. වෙරළ ආශ්‍රිත ප්‍රදේශවල ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම වන්නේ, ............................................................ කර්මාන්තය යි.

15. ලෝකයේ ප්‍රධාන සාගර අතරින් ආක්ටික් සාගරය .................................................................. සාගරය වේ.

- **අංක 16 සිට 20 තෙක් ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර දී ඇති පිළිතුරු අතරින් තෝරා යටින් ඉරක් අඳින්න.**

16. ශ්‍රී ලංකාව තුළ නිදහස් වෙළඳ කලාපයක් පිහිටා ඇති ස්ථානය මින් කුමක් ද?

(1) මීගමුව (2) කටුනායක (3) සීතාවක (4) පෑලියගොඩ

17. අභ්‍යන්තර තැනිතලාව තුළ පිහිටා ඇති භූ විෂමතා ලක්ෂණයකි,

(1) ශේෂ කඳු (2) කලපු (3) සානු (4) කඳුවැටි

18. පෘථිවි ආදර්ශ ගෝලයේ ඇති දේශාංශ රේඛා ගණන,

(1) $180^o$ කි. (2) $90^o$ කි. (3) $360^o$කි. (4) $200^o$ කි.

19. ශ්‍රී ලංකාවේ ආදිවාසී ජනයා මහවැලි ගොවිජනපද ආශ්‍රිතව පදිංචි කර ඇති ස්ථානයකි.

(1) රාජාංගනය (2) ගිරාඳුරුකෝට්ටේ (3) ඇලහැර (4) හෙන්නානිගල

20. ශ්‍රී ලංකාව පිහිටා ඇත්තේ,

(1) නිවර්තන කලාපය තුළය. (2) සෞම්‍ය කලාපය තුළය.

(3) ශීත කලාපය තුළය. (4) අතරමැදි කලාපය තුළය.


(2 x 20 = ල. 40)

## II - කොටස

සැලකිය යුතුයි -

- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පිළිතුරු ලිවීම සඳහා වෙන ම කඩදාසියක් යොදා ගන්න.**

01. (අ) පහත සඳහන් ලෝක ආකෘතික සිතියමේ ලකුණු කර ඇති දෑ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(i) A අක්ෂරයෙන් පෙන්නුම් කරන අක්ෂාංශ රේඛාව කුමක් ද? (ල. 02)


(ii) G අක්ෂරයෙන් දැක්වෙන සාගරය කුමක් ද? (ල. 02)

(iii) K අක්ෂරයෙන් දැක්වෙන දූපත කුමක් ද? (ල. 02)

(iv) රුසියාව දැක්වෙන අක්ෂරය කුමක් ද? (ල. 01)

(v) පෝක් සමුද්‍ර සන්ධිය දැක්වෙන අක්ෂරය කුමක් ද? (ල. 01)

(ආ) යාබද ශ්‍රී ලංකා ආකෘති සිතියමේ ලකුණු කර ඇති දෑ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(i) G අක්ෂරයෙන් දැක්වෙන මෝසම් සුළං වර්ගය කුමක් ද? (ල. 02)

(ii) J අක්ෂරයෙන් දැක්වෙන ගංගාව කුමක් ද? (ල. 02)

(iii) K අක්ෂරයෙන් දැක්වෙන නගරය කුමක් ද? (ල. 02)

(iv) පේදුරු තුඩුව දැක්වෙන අක්ෂරය කුමක් ද? (ල. 01)

(v) අනුරාධපුර දිස්ත්‍රික්කය දැක්වෙන අක්ෂරය කුමක් ද? (ල. 01)

02. (i) පෘථිවි භ්‍රමණය යනු කුමක්දැයි කෙටියෙන් හඳුන්වන්න. (ල. 02)

(ii) අධික අවුරුද්දක් ඇතිවන ආකාරය පැහැදිලි කරන්න. (ල. 04)

(iii) ''පෘථිවිය පූර්ණ ගෝලයක් නොවේ'' මෙම කියමන පැහැදිලි කරන්න. (ල. 05)

03. (i) භූගෝලීය වශයෙන් ශ්‍රී ලංකාවේ පිහිටීම සඳහන් කරන්න. (ල. 02)

(ii) ශ්‍රී ලංකාවේ සාපේක්ෂ පිහිටීම පහත දිශාවන්ට අනුව දක්වන්න. (ල. 04)

(a) උතුරින් -

(b) දකුණින් -

(c) නැගෙනහිරින් -

(d) බටහිරින් -

(iii) (a) නිරපේක්ෂ පිහිටීම යනු කුමක් ද? (ල. 02)

(b) ශ්‍රී ලංකාවේ නිරපේක්ෂ පිහිටීම දැක්වෙන පහත සටහනේ හිස්තැන්වලට අදාළ පිළිතුරු අංක පිළිවෙලින් පිළිතුරු පත්‍රයේ ලියන්න. (ල. 03)

''උතුරු අක්ෂාංශ (1) .......................................... හා ''$9^{o}51^{/}$ අතර ද (2) .................................. දේශාංශ $79^{o}41^{/}$ හා (3) ....................................... අතර ද ශ්‍රී ලංකාව පිහිටා ඇත.

04. (i) පහත රූප සටහන් දෙකෙන් දැක්වෙන්නේ කුමන ආගම්වලට අයත් ආගමික ස්ථාන දැයි A, B පිළිවෙලින් ලියන්න. (ල. 02)



A .......................................




B .......................................

(ii) ලෝක උරුම ලෙස ප්‍රකාශයට පත්කර ඇති ශ්‍රී ලංකාවේ ස්ථාන තුනක් සඳහන් කරන්න.(ල. 03)

(iii) (a) ජාතික උරුම බෙදා දක්වන කොටස් දෙක සඳහන් කරන්න. (ල. 02)

(b) පහත සඳහන් උරුමයන් ඔබ ඉහත නම්කළ කොටස් දෙකට වෙන් කර ලියන්න.

- ⋆ නල්ලූර් කෝවිල
- ⋆ උඩරට නැටුම් කලාව
- ⋆ ආගන්තුක සත්කාරය
- ⋆ රන්මසු උයන (ල. 04)

05. (i) සාමාන්‍යයෙන් ශ්‍රී ලංකාවට වියළි කාලගුණයක් පවතින මාස දෙක සඳහන් කරන්න. (ල. 02)

(ii) ශ්‍රී ලංකාවේ එක් එක් ප්‍රදේශවල දක්නට ලැබෙන ශාකවල විවිධත්වයක් පැවතීමට බලපා ඇති සාධක තුනක් සඳහන් කරන්න. (ල. 03)

(iii) (a) A, B හා C රූප සටහන් වලින් පෙන්නුම් කෙරෙන්නේ ශ්‍රී ලංකාවේ වෘක්ෂලතා වර්ග තුනකි. ඒවා හඳුනාගෙන පිළිවෙළින් නම් කරන්න. (ල. 03)


A


B


C

(b) එක් එක් ප්‍රදේශවල ශාක ස්වභාවය ඇසුරෙන් පහත වගුවේ හිස්තැන් වලට අදාළ පිළිතුරු පිළිවෙලින් ලියන්න. (ල. 03)

| ප්‍රදේශය | ශාකවල ලක්ෂණ |
|---|---|
| තෙත් ප්‍රදේශ | 1 ................................................ |
| කඳුකර ප්‍රදේශ | 2 ................................................ |
| 3 ................................................ | කටු පඳුරු සහිත වන ලැහැබ් |

06. (i) ශ්‍රී ලංකාවේ කඳුකර භූ දර්ශනයට අයත් වන්නේ මුහුදු මට්ටමේ සිට කොපමණ උසකින් යුත් ප්‍රදේශ ද? (ල. 02)

(ii) කඳුකර භූ දර්ශනය තුළ දක්නට ලැබෙන පහත සඳහන් භූ ලක්ෂණවලට උදාහරණ දෙක බැගින් ලියන්න. (ල. 06)

(a) කඳු වැටි (b) සානු (c) දියඇලි

(iii) කඳුකර ප්‍රදේශවල සිදු කෙරෙන ආර්ථික ක්‍රියාකාරකම් දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 03)

07. ශ්‍රී ලංකාවේ වැඩිම භූමි ප්‍රමාණයක් අයත්වන්නේ වියළි කලාපීය භූ දර්ශනයටයි.

(i) ශ්‍රී ලංකාවේ වියළි කලාපීය භූ දර්ශනය දැකිය හැකි ප්‍රදේශ දෙකක් සඳහන් කරන්න. (ල. 02)

(ii) වියළි කලාපීය භූ දර්ශනයේ පදනම සකස් වීමට බලපා ඇති දේශගුණික සාධක දෙකක් සඳහන් කරන්න. (ල. 02)

(iii) වියළි කලාපයේ පවතින භෞතික හා මානුෂ භූ දර්ශනයේ ලක්ෂණ ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න. (ල. 07)

| ශේෂ කඳු | අභය භූමි | ආගමික සිද්ධස්ථාන | කෘෂිකාර්මික කටයුතු |
|---|---|---|---|
| 1 ............................... | 3 ............................... | 5 ............................... | 7 ............................... |
| 2 ............................... | 4 ............................... | 6 ............................... | |

**7 ශ්‍රේණිය** **දෙවන වාර පරීක්ෂණය 2025** **භූගෝල විද්‍යාව**

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01. | මකර | 06. | ✓ | 11. | ශ්‍රී ලංකාව | 16. | 2 |
| 02. | නිරපේක්ෂ | 07. | ✓ | 12. | වැව් | 17. | 1 |
| 03. | 12 | 08. | ✗ | 13. | උතුරු | 18. | 3 |
| 04. | අප්‍රේල් | 09. | ✗ | 14. | ධීවර | 19. | 4 |
| 05. | කඳුකර | 10. | ✓ | 15. | කුඩාම | 20. | 1 |

## II කොටස

(2 x 20 = ල. 40)

01. (අ) (i) සමකය (ල. 02)
(ii) අත්ලාන්තික් සාගරය (ල. 02)
(iii) මැඩගස්කරය (ල. 02)
(iv) D (ල. 01)
(v) M (ල. 01)

(ආ) (i) නිරිත දිග (ල. 02)
(ii) දැදුරු ඔය (ල. 02)
(iii) කොළඹ (ල. 02)
(iv) B (ල. 01)
(v) D (ල. 01)

02. (i) පෘථිවිය තම අක්ෂය වටා කරකැවීම. (පෘථිවිය තමා වටා කරකැවීම.) (ල. 02)
(ii) පෘථිවිය සූර්යා වටා කරකැවීමට දින 365 යි පැය 6 ක් ගතවේ. වසර හතරකට වරක් පැය 6 බැගින් එකතු කොට සම්පූර්ණ දිනයක් ලෙස සලකා එම අවුරුද්දට දින 366 ක් වේ. එම අවුරුද්ද අධික අවුරුද්දක් ලෙස සලකයි. (ල. 04)
(iii) පෘථිවිය පූර්ණ ගෝලයක් නම් සමක විෂ්කම්භය හා ධ්‍රැවක විෂ්කම්භය සමානය එමෙන් ම සමක පරිදිය හා ධ්‍රැවක පරිදිය සමාන විය යුතුය. නමුත් සමක පරිධිය විශාලයත එහෙයින් පෘථිවිය පූර්ණ ගෝලයක් නොවේ. (ල. 05)

03. (i) නිවර්තන කලාපය තුළ සමකයට ආසන්නත පිහිටා ඇත. (ල. 02)
(ii) (a) ආසියා මහාද්වීපය (b) ඉන්දියන් සාගරය
(c) ගිනිකොණදිග ආසියා රටවල් (d) අප්‍රිකා මහාද්වීපය (ල. 04)
(iii) (a) අක්ෂාංශ හා දේශාංශ පදනම් ව රටක පිහිටීම ප්‍රකාශ කිරීම. (ල. 02)
(b) 1 $5^{o}55^{/}$ 2. නැගෙනහිර 3. $81^{o}53^{/}$ (ල. 03)

04. (i) A- හින්දු ආගම B - කතෝලික ආගම (ල. 02)
(ii) අනුරාධපුර පූජා නගරය / මහනුවර පූජා නගරය / පොළොන්නරුව පැරණි නගරය / රන්ගිරි දඹුලු විහාරය / ගාලු කොටුව / සීගිරිය / සිංහරාජ වනාන්තරය (ල. 03)
(iii) (a) ස්පෘශ්‍ය උරුම / අස්පෘශ්‍ය උරුම (ල. 02)
(b) ස්පෘශ්‍ය - නල්ලූර් කෝවිල / රන්මසු උයන
අස්පෘශ්‍ය - ආගන්තුක සත්කාරය / උඩරට නැටුම් කලාව (ල. 04)

05. (i) පෙබරවාරි / අගෝස්තු / (ල. 02)
(ii) වර්ෂාපතනය / උෂ්ණත්වය / උච්චත්වය (ල. 03)
(iii) (a) A තෘණ භූමි (තෘණ තලා) B කඩොලාන C කටු පඳුරු (ල. 03)
(b) 1. උසින් වැඩි ශාක 2. උසින් අඩු ශාක 3. වියළි හා අර්ධ ශුෂ්ක ප්‍රදේශ (ල. 03)

06. (i) 300 m ට වඩා වැඩි (ල. 02)
(ii) (a) කඳුවැටි - පිදුරුතලාගල / සමනල / නකල්ස් / නමුණුකුල / ලුණුගල / රාගල / දොලොස්බාගේ
(b) සානු -හැටන් / වැලිමඩ / මහනුවර / කොස්ලන්ද / මහවලතැන්න
(c) දිය ඇලි - දුන්හිඳ / බඹරකන්ද / දියළුම / ලක්ෂපාන ආදී..... (ල. 06)
(iii) තේ වගාව / එළවළු, පලතුරු වාගව / සත්ව පාලනය / විසිතුරු මල් වගාව / සංචාරක කර්මාන්තය (ල. 03)

07. (i) උතුරු / උතුරු මැද / නැගෙනහිර / ගිනිකොණ දිග ප්‍රදේශ
(අදාළ දිස්ත්‍රික්ක වලට දී ලකුණු ලබා දෙන්න.) (ල. 02)
(ii) දැඩි නියගය / අධික උෂ්ණත්වය / අඩු වර්ෂාපතනය / ඉහළ වාෂ්පීකරණය (ල. 02)
(iii) 1, 2 සීගිරිය / දඹුල්ල / රිටිගල / කතරගම / දිඹුලාගල
3, 4 - යාල / විල්පත්තු / කුමන
5, 6 - මඩු දේවස්ථානය / කෝනේෂ්වරම් කෝවිල / කතරගම දේවාලය / ඉස්ලාම් දේවස්ථාන / චෛත්‍ය
7 - වී වගාව / හේන් වගාව (ල. 07)